ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

---

# 1995 අංක 30 දරන

# ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය පනත

---

[සහතිකය සටහන් කළේ 1995 දෙසැම්බර් මස 11 වන දින]

(ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.)

---

1995 දෙසැම්බර් මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 1.50 යි

තැපැල් ගාස්තුව : රු. 2.55 යි.

# 1995 අංක 30 දරන ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 1995 දෙසැම්බර් මස 11 වන දින.]

එල්. ඩී.—ඕ. 57/94

**ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය පිහිටුවීම සඳහා ද තරුණයන්, ස්ත්‍රීන් සහ අවාසිසහගත තත්ත්වයට පත්වී ඇති කණ්ඩායම් ආර්ථික හා සාමාජික සංවර්ධන කටයුතුවලට එක් කර ගැනීමේ, සාමාජික ස්ථාවරභාවය ප්‍රවර්ධනය කිරීමේ සහ දුගී බව තුරන් කිරීමේ අදහස ඇතිව, අධිකාරිය විසින් සමෘද්ධි වැඩසටහන සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.*

1. මේ පනත 1995 අංක 30 දරන ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

## ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය පිහිටුවීම

*ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය පිහිටුවීම.*

2. (1) (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 3 වන වගන්තිය යටතේ පත් කරනු ලබන තැනැත්තන්ගෙන් සමන්විත වන්නා වූ ද ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ ද අධිකාරියක් පිහිටුවනු ලැබේ.

(2) අධිකාරිය (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් සංස්ථාපිත වන අතර, එයට අඛණ්ඩ පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තවද අධිකාරිය විසින් ද අධිකාරියට විරුද්ධව ද එම නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය.

*අධිකාරියේ අධ්‍යක්ෂවරුන්*

3. (1) අධිකාරිය —

(අ) නිල බලයෙන් පත් කරනු ලබන අධ්‍යක්ෂවරුන් සතර දෙනකුගෙන්, එනම්,

(i) (මෙහි මින් මතු "ලේකම්" යනුවෙන් සඳහන් කරනු ලබන) ග්‍රාමීය සංවර්ධන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්;

(ii) මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්;

(iii) 10 වන වගන්තිය යටතේ පත් කරනු ලබන සමෘද්ධි කොමසාරිස් ජනරාල්;

(iv) දිළිඳු සහන කොමසාරිස්; සහ

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන වෙනත් අධ්‍යක්ෂවරුන් තිදෙනකුගෙන් (මේ ඡේදය යටතේ පත් කරනු ලබන අධ්‍යක්ෂවරයකු "පත් කරන ලද අධ්‍යක්ෂවරයා" යන්නෙන්, මෙහි මින් මතු සඳහන් කරනු ලැබිය යුතු ය.)

සමන්විත විය යුතු ය.

2—ඩී 036788 (95/09)

(2) අමාත්‍යවරයා විසින්, අධ්‍යක්ෂවරුන් අතුරෙන් එක් අධ්‍යක්ෂවරයකු (මෙහි මින් මතු "අධ්‍යක්ෂ ජනරාල්" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

(3) අධ්‍යක්ෂවරුන්ගේ ධුර කාල, අධ්‍යක්ෂවරුන්ට ගෙවනු ලබන පාරිශ්‍රමික, අධිකාරියේ රැස්වීම් සහ අධිකාරියේ මුද්‍රාවට අදාළව මේ පනතේ උපලේඛනයේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

අධිකාරියේ කර්තව්‍ය.

4. අධිකාරියේ කර්තව්‍ය වනුයේ සමාජයේ තරුණයන්, ස්ත්‍රීන් සහ අවාසි සහගත තත්ත්වයට පත්ව ඇති කණ්ඩායම්වල ආර්ථික සහ සාමාජික තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා —

(අ) ඔවුන්ගේ ආදායම වැඩි කිරීමෙන් සහ රැකියා අවස්ථා පුළුල් කිරීමෙන් ;

(ආ) ඔවුන් ආර්ථික සහ සාමාජික සංවර්ධන කටයුතුවලට එක් කර ගැනීමෙන් ;

(ඇ) පවුල් මට්ටමේ ආර්ථික කටයුතු ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සමග ගම්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ පළාත් මට්ටමින් සම්බන්ධ කිරීමෙන් ;

(ඈ) ඔවුන්ගේ අභිවෘද්ධිය සඳහා ව්‍යාපෘති සහ යෝජනා ක්‍රම සැලසුම් කිරීමෙහි සහ කළමනාකරණය කිරීමෙහි ලා ඔවුන්ගේ සහභාගිත්වය ලබා ගැනීමෙන් ;

(ඉ) ඔවුන් අතර සහයෝගිතාව ඇති කිරීමෙන්, ඔවුන් අතර ඉතිරි කිරීම් වඩවාලීමෙන් සහ ණය පහසුකම් ලබාගැනීමට ඔවුනට සහායවීමෙන් ;

(ඊ) ආණ්ඩුවේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන, පෞද්ගලික අංශයේ සංවිධාන සහ ආණ්ඩුවේ නොවන සංවිධානවල ආධාර සහ සේවාවන් වැඩසට-හනේ අර්ථලාභීන්ට බෙදාහැරීමේ පහසුකම් සැලසීමෙන්.

(මෙහි මින් මතු "වැඩසටහන" යනුවෙන් සඳහන් කරනු ලබන) සමෘද්ධි ජාතික වැඩසටහන යනුවෙන් හඳුන්වනු ලබන වැඩ සටහනක් ක්‍රමවත් ලෙස සකස් කිරීම සහ එසේ ක්‍රමවත් ලෙස සකස් කරනු ලැබූ වැඩසටහන සහ දුගී බව තුරන් කිරීම සඳහා වූ ආණ්ඩුවේ වෙනත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ය.

අධිකාරියේ බලතල.

5. වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අධිකාරියට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය :—

(අ) දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය මට්ටමින් දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය සමෘද්ධි කමිටු පිහිටුවා පවත්වාගෙන යාම ;

(ආ) කෘෂිකාර්මික, ධීවර හා කාර්මික ආධාර තොරතුරු, කළමනාකරණ සහ උපදේශක සේවා වැඩසටහනේ අර්ථලාභීන්ට සැපයීම සඳහා ගම් සමූහ මට්ටමින් හා ගම් මට්ටමින් සමෘද්ධි මධ්‍යස්ථාන සහ සමෘද්ධි බලකාය පිහිටුවා පවත්වා ගෙන යාම ;

(ඇ) වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙහි ලා ක්‍රියාකාරි තරුණ සහභාගිත්වය සහතික කිරීම සඳහා ගම් මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින්, ප්‍රාදේශීය මට්ටමින් සහ ජාතික මට්ටමින්, තරුණයන්ගෙන් සමන්විත කමිටු පිහිටුවීම;

(ඈ) වැඩසටහන යටතේ අර්ථලාභීන් සඳහා ඉතිරි කිරීමේ සහ ණය යෝජනා ක්‍රම පිහිටුවීම, කළමනාකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(ඉ) අර්ථලාභී පවුල්වල නිෂ්පාදන ගබඩා කිරීම, සැකසීම සහ විකිණීම සඳහා (අලෙවි මධ්‍යස්ථාන සැපයීම ඇතුළුව) අලෙවි සේවා සැපයීම;

(ඊ) සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් සොයා ගැනීමට ජාතික ලොතරැයි මණ්ඩලයේ සහාය ඇතිව ලොතරැයි පැවැත්වීම පිණිස කටයුතු පිළියෙල කිරීම;

(උ) සංවර්ධන කටයුතු ගම් මට්ටමින් සැලසුම් කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා වැඩසටහනේ අර්ථලාභීන්ගේ කමිටු පත් කිරීම;

(ඌ) කෘෂිකාර්මික ඵලදායිතාව, ස්වයං රැකියා සහ කුඩා ව්‍යවසාය සංවර්ධනය නගා සිටුවීමේ අදහසින් වැඩසටහනේ අර්ථලාභීන්ට සහ අර්ථලාභී පවුල්වලට පුහුණුව, කළමනාකරණය, උපදේශක හා තොරතුරු සේවා සහ කෘෂිකාර්මික, ධීවර සහ කාර්මික ආදාන සැපයීම;

(එ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම හා දැරීම සහ ඒ දේපළ විකිණීම, පැවරීම, බදුදීම, උකස් කිරීම හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීම;

(ඒ) දේශීය හෝ විදේශීය මාර්ගවලින්, මුදලින් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම;

(ඔ) අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම හෝ එහි බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු කොන්ත්‍රාත්තු සහ ගිවිසුම්වලට සෘජුවම හෝ නිලධරයන් මඟින් හෝ අධිකාරිය විසින් ඒ සඳහා ලියවිල්ලකින් බලය දෙන ලද අනුයෝජිතයන් මඟින් හෝ ඇතුළත්වීම සහ ඒවා ඉටු කිරීම.

## II වන කොටස

### දිස්ත්‍රික් සමෘද්ධි කමිටු ප්‍රාදේශීය සමෘද්ධි කමිටු සමෘද්ධි මධ්‍යස්ථාන සහ සමෘද්ධි බලකාය

6. (1) එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය තුළ (මෙහි මින් මතු "දිස්ත්‍රික් කමිටුව" යනුවෙන් හඳුන්වනු ලබන) දිස්ත්‍රික් සමෘද්ධි කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු අතර, එය, එහි සභාපති වශයෙන් ඒ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පත් කරනු ලබන දිස්ත්‍රික් ලේකම්ගෙන් ද අධිකාරියේ අදාළ නිලධරයන් තිදෙනකුගෙන් සහ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල, පළාත් රාජ්‍ය සේවයේ, පෞද්ගලික අංශ ආයතනවල, ආණ්ඩුවේ නොවන සංවිධානවල නියෝජිතයන්ගෙන් සහ සමෘද්ධි කොමසාරිස් ජනරාල් සහ අධිකාරිය විමසා දිස්ත්‍රික් ලේකම් විසින් නිශ්චය කරනු ලැබිය හැක්කා වූ ද එම පරිපාලන දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන්නා වූ හෝ පවත්නා වූ වැඩසටහන යටතේ අර්ථලාභී යම් සංඛ්‍යාවකගෙන් ද සමන්විත විය යුතු ය. දිස්ත්‍රික් සමෘද්ධි කමිටු

(2) යම් දිස්ත්‍රික් කමිටුවක් පිහිටුවන ලද්දේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා ද ඒ පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත වූ වැඩ සටහන සහ දුගී බව තුරන් කිරීමේ වෙනත් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට අදාළ සියලු කරුණු පිළිබඳව දිස්ත්‍රික් කමිටුව විසින් උපදෙස් දෙනු ලැබිය යුතු අතර සමෘද්ධි කොමසාරිස් ජනරාල් සහ අධිකාරිය විසින් නියම කරනු ලැබූ විට සමෘද්ධි කොමසාරිස් ජනරාල් සහ අධිකාරිය වෙත වාර්තා ඉදිරිපත් කළ යුතු ය.

ප්‍රාදේශීය සමෘද්ධි කමිටුව.

7. (1) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් තුළ (මෙහි මින් මතු "ප්‍රාදේශීය කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සමෘද්ධි කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු අතර, එය, එහි සභාපති වශයෙන් පත් කරනු ලබන එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ද අධිකාරියේ අදාළ නිලධර යන් තිදෙනකුගෙන් සහ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල, පළාත් රාජ්‍ය සේවයේ, ආණ්ඩුවේ නොවන සංවිධානවල නියෝජිතයන්ගේ සහ සමෘද්ධි කොමසාරිස් ජනරාල් සහ අධිකාරිය විමසා ප්‍රාදේශීය ලේකම් විසින් නිශ්චය කරනු ලැබිය හැක්කා වූ ද එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක වන්නා වූ හෝ පවත්නා වැඩ සටහන යටතේ අර්ථලාභීන්ගෙන් යම් සංඛ්‍යාවකගෙන් ද සමන්විත විය යුතු ය.

(2) යම් ප්‍රාදේශීය කමිටුවක් පිහිටුවන ලද්දේ යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් ඇතුළත ද ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත වූ වැඩසටහන සහ දුගී බව තුරන් කිරීමේ ආණ්ඩුවේ වෙනත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළ සියලු කරුණු පිළිබඳව, ඒ ප්‍රාදේශීය කමිටුව විසින් උපදෙස් දෙනු ලැබිය යුතු අතර, සමෘද්ධි කොමසාරිස් ජනරාල් සහ අධිකාරිය විසින් නියම කරනු ලැබූ විට, ඒ කමිටුව විසින් සමෘද්ධි කොමසාරිස් ජනරාල් සහ අධිකාරිය වෙත වාර්තා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

සමෘද්ධි මධ්‍යස්ථාන.

8. (1) අධිකාරිය විමසා, ප්‍රාදේශීය ලේකම් විසින් නිශ්චය කරනු ලබන ග්‍රාම නිලධාරි කොට්ඨාස සමූහයක ප්‍රාදේශීය ලේකම් විසින් නිශ්චය කරනු ලබන සමූහය සෑදුම්ලත් ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාස වල වැඩසටහන යටතේ වාසය කරන අර්ථලාභීන් අතුරෙන් යම් නියෝජිත සංඛ්‍යාවකගෙන් සමන්විත සමෘද්ධි මධ්‍යස්ථානයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) සමෘද්ධි මධ්‍යස්ථානයේ කර්තව්‍ය —

(අ) ඒ සමූහයේ ග්‍රාම නිලධාරි කොට්ඨාස සඳහා පිහිටුවන ලද සමෘද්ධි බලකායේ කටයුතු සැලසුම් කිරීම සහ ඒකාබද්ධ කිරීම;

(ආ) ඒ සමූහයේ ග්‍රාම නිලධාරි කොට්ඨාස සඳහා පිහිටුවන ලද සමෘද්ධි බලකායේ කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් බැංකු සහ ණය දෙන ආයතනවල සහයෝගය ඇතිව අවශ්‍ය ණය සහ බැංකු පහසුකම් සැපයීම සහ පුහුණුව, කළමනාකරණය සහ වෙනත් උපදේශන සේවාවන් ද සැපයීම;

(ඈ) වැඩ සටහනේ අර්ථලාභීන්ගේ ඉතිරි කිරීම් මෙහෙයවීම ;

(ඉ) ග්‍රාම නිලධාරි මට්ටමින් නිෂ්පාදන සම්පත් වැඩි දියුණු කිරීමේ අදහසින් ග්‍රාම සංවර්ධනය සඳහා අවශ්‍ය පොදු කාර්ය පහසුකම් සැලසුම් කිරීම සහ සැපයීම ;

(ඊ) සමෘද්ධි බලකාය මට්ටමින් වැඩ සටහන ක්‍රියාත්මක කිරීම පහසුකරලීමට, ඒ සමූහයේ ග්‍රාම නිලධාරි කොට්ඨාස පිහිටියා වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා පිහිටුවන ලද ප්‍රාදේශීය කමිටු සමග සම්බන්ධීකරණය කිරීම

කිය යුතු ය.

9. (1) එක් එක් ග්‍රාම නිලධාරි කොට්ඨාසය සඳහා සමෘද්ධි බලකායක් පිහිටුවනු ලැබිය යුතු අතර, එය ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පදිංචි සියලුම තරුණයන්ගෙන් සමන්විත විය යුතු ය. සමෘද්ධි බලකාය

(2) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද එක් එක් සමෘද්ධි බලකාය සඳහා, ඒ සමෘද්ධි බලකායේ වාර්ෂික සභා රැස්වීමේ දී බලකායේ නියෝජිතයන් විසින් තෝරා පත්කරගනු ලබන තරුණයන් හත් දෙනකුගෙන්, සමෘද්ධි නියාමකගෙන් හා ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසය පිහිටා ඇත්තේ යම් ප්‍රදේශයක් ඇතුළත ද, ඒ ප්‍රදේශය සඳහා පත්කරන ලද ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සමෘද්ධි කොමසාරිස් ජනරාල්වරයා විමසා නම් කරනු ලබන ඒ ප්‍රදේශයේ ක්‍රීඩා, තරුණ කටයුතු හා ග්‍රාම සංවර්ධන කටයුතුවල නියුක්ත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල හා රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයන් පස් දෙනකුගෙන් සමන්විත විධායක සභාවක් විය යුතු ය ;

(3) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද එක් එක් සමෘද්ධි බලකායේ කර්තව්‍ය ඉටුකිරීමේදී හා ඒ එක් එක් සමෘද්ධි බලකායට උපදෙස්දීමේ හා සහායවීමේ කාර්ය සඳහා උපදේශක සභාවක් පිහිටුවනු ලැබිය යුතු අතර, ඒ සමෘද්ධි බලකාය පිහිටුවනු ලැබුවේ යම් ග්‍රාම නිලධාරි කොට්ඨාසයක් සඳහා ද ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සමාජ හා සුභසාධන කටයුතුවල නියුක්ත තරුණයන් නොවන තැනැත්තන් හත් දෙනකුගෙන් ඒ උපදේශක සභාව සමන්විත විය යුතු ය ;

(4) සමෘද්ධි බලකායේ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

(අ) වැඩ සටහනේ සංවර්ධන ව්‍යාපෘතිවලට සම්බන්ධ සියලු කටයුතු පවුල් මට්ටමින් සහ වැඩසටහනේ සංවර්ධන ව්‍යාපෘති ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටමින් සම්බන්ධීකරණය කිරීම සහ දිරිමත් කිරීම ;

(ආ) සමෘද්ධි බලකාය පිහිටුවන ලද්දේ යම් ග්‍රාම නිලධාරි කොට්ඨාසයක් සඳහා ද ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වැඩසටහනේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙහිලා අවශ්‍ය ණය සහ බැංකු පහසුකම් බැංකු සහ වෙනත් ණය දෙන ආයතනවල සහයෝගය ඇතිව සැපයීම සහ පුහුණුව, කළමනාකරණය සහ වෙනත් උපදේශක සේවාවන් ද සැපයීම ;

(ඇ) වැඩසටහනේ අර්ථලාභීන්ගේ ඉතිරි කිරීම් මෙහෙය වීම ;

(ඈ) ස්වකීය සමාජ අභිවර්ධනය සම්බන්ධයෙන් එම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ සංවර්ධන ව්‍යාපෘති සහ කටයුතු සැලසුම් කිරීමෙහි හා කළමනාකරණයෙහිලා ඒ කොට්ඨාසයේ වාසය කරන අර්ථලාභීන් සහභාගී කරවා ගැනීම ;

(ඉ) වැඩසටහනට අදාළව, ඒ ග්‍රාම නිලධාරී කොට්ඨාස පිහිටා ඇති ප්‍රදේශය සඳහා පත් කරන ලද ප්‍රාදේශීය කමිටුව විසින් පවරනු ලබන වෙනත් කටයුතු භාර ගැනීම ;

## III වන කොටස

## සමෘද්ධි කොමසාරිස් ජනරාල්

සමෘද්ධි කොමසාරිස් ජනරාල් පත් කිරීම.

10. (1) මේ පනතේ කාර්ය සඳහා නමින් හෝ ධූරයෙන් සමෘද්ධි කොමසාරිස් ජනරාල්වරයකු (මෙහි මින් මතු "කොමසාරිස් ජනරාල්" වශයෙන් සඳහන් කරනු ලබන) පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි කොමසාරිස්වරුන්, දිස්ත්‍රික් කොමසාරිස්වරුන්, නියෝජ්‍ය කොමසාරිස්වරුන් සහ සහකාර කොමසාරිස්වරුන් යම් සංඛ්‍යාවක් නමින් හෝ ධූරයෙන් පත් කරනු ලැබිය යුතු ය.

(3) සෑම දිස්ත්‍රික් ලේකම්වරයකු විසින් ම, මේ පනතින් කොමසාරිස් ජනරාල් වෙත පිරිනමන ලද හෝ නියම කරන ලද හෝ පවරන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය, තමාගේ පත් වීමට අදාල වූ පරිපාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන්, ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය. සෑම ප්‍රාදේශීය ලේකම්වරයකු විසින් ම, මේ පනතින් කොමසාරිස් ජනරාල් වෙත පිරිනමන ලද හෝ නියම කරන ලද හෝ පවරන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය, තමාගේ පත්වීමට අදාළ පරිපාලන කොට්ඨාසය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය.

(4) යම් දිස්ත්‍රික් කොමසාරිස්වරයකු හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකු මුළු ශ්‍රී ලංකාව සඳහා හෝ එහි යම් කොටසක් සඳහා පත් කරනු ලැබිය හැකි ය.

වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා කොමසාරිස් ජනරාල් සහාය විය යුතු බව.

**11.** 5 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, කොමසාරිස් ජනරාල් විසින්, ලේකම්ගේ විධාන සහ පාලනය යටතේ, අධිකාරිය සහ අදාල අමාත්‍යාංශය, ආණ්ඩුවේ දෙපාර්තමේන්තු හා වෙනත් ආයතන සමග සම්බන්ධීකරණය කිරීමෙන් ආණ්ඩුවේ වැඩසට හන හා දුගී බව තුරන් කිරීමේ වෙනත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙහි ලා පහසුකම් සැලසීම සහ සහාය දීම කරනු ලැබිය යුතු ය.

නිලධරයන්ගේ බලතල සහ කාර්ය.

**12.** (1) සෑම කොමසාරිස්වරයෙක්, දිස්ත්‍රික් කොමසාරිස්වර යෙක්, නියෝජ්‍ය කොමසාරිස්වරයෙක් සහ සහකාර කොමසාරිස් වරයෙක් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ කාර්ය කිරීමේ දී හෝ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ දී කොමසාරිස් ජනරාල්වර යාගේ පොදු විධිවිධානවලට සහ පාලනයට යටත් විය යුතු ය.

(2) සෑම කොමසාරිස්වරයෙක්, දිස්ත්‍රික් කොමසාරිස්වරයෙක්, නියෝජ්‍ය කොමසාරිස්වරයෙක් හෝ සහකාර කොමසාරිස් වරයෙක් විසින් ම කොමසාරිස් ජනරාල්වරයාගේ පොදු විධා නයට සහ පාලනයට යටත්ව, ස්වකීය පත්වීමේ ප්‍රදේශය ඇතුළත මේ පනතින් හෝ ඒ යටතේ කොමසාරිස් ජනරාල්වරයා වෙත පිරිනමන ලද හෝ නියම කරන ලද හෝ පවරන ලද බලතල, කාර්ය හෝ කර්තව්‍ය සියල්ලම හෝ ඉන් කිසිවක් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටුකිරීම, කරනු ලැබිය හැකි ය.

තොරතුරු කැඳවීම සඳහා කොමසාරිස් ජනරාල්ගේ බලය.

**13.** කොමසාරිස් ජනරාල් විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, දැන්වීමෙහි සඳහන් කරනු ලැබිය හැකි යම් කාලයක් ඇතුළත මේ පනත යටතේ තමා වෙත කරන ලද යම් ප්‍රකාශයක ඇතුළත් යම් ප්‍රකාශයක් නිවැරදි බව නිසැකව දැනගැනීමෙහි ලා අවශ්‍ය විය හැකි යම් තොරතුරක් තමා වෙත සපයන ලෙස යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි අතර, ඒ නියමයට අනුකූලව කටයුතු කිරීම ඒ තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

## IV වන කොටස

## අධිකාරියේ කාර්ය මණ්ඩලය

අධිකාරියේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම.

**14.** (1) අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා අධ්‍යක්ෂ ජනරාල් විය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයාට ප්‍රතිපත්ති පිළිබඳ කරුණු සම්බන්ධයෙන් අධිකාරියේ පොදු විධානයට යටත්ව, අධිකාරියේ කටයුතු මෙහෙයවීම සහ අධිකාරියේ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම භාර කළ යුතු ය.

(3) මේ පනත යටතේ අධිකාරියේ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සහ කාර්ය කිරීම සඳහා අවශ්‍ය යයි සලකන යම් නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් යම් සංඛ්‍යාවක් පත් කිරීමේ සහ එසේ පත් කරන ලද යම් නිලධරයකු, අනුයෝජිතයකු හෝ සේවකයකු සම්බන්ධයෙන් විනයානුකූල පාලනයක් කිරීමේ සහ ඔවුන් සේවයෙන් පහ කිරීමේ බලය අධිකාරියට ඇත්තේ ය.

(4) අධිකාරිය විසින්, එහි බලතල අතුරෙන් බලතල කිසිවක් අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ (3) වන උපවගන්තිය යටතේ පත් කරන ලද යම් නිලධරයකුට පවරනු ලැබිය හැකි අතර, ඒ බලතල පවරන ලද්දේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා විසින් අධිකාරියේ විධානයට යටත්ව ඒ බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(5) (3) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් හට, අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් යම් අනුපාතයකට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර, යම් සේවා කොන්දේසිවලට ද ඔවුන් යටත් විය යුතු ය.

(6) අධිකාරියේ ඉල්ලීම පිට, රජයේ සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව අධිකාරියේ කාර්ය මණ්ඩලයට එවැනිම කැමැත්ත ඇතිව අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා තාවකාලිකව පත් කළ හැකිය, හෝ එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් හෝ පත් කළ හැකි ය.

(7) රජයේ සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් පත් කරනු ලැබ ඇති අවස්ථාවක 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම නිලධරයා කෙරෙහි සහ එම නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(8) රජයේ සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබ ඇති අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම නිලධරයා කෙරෙහි සහ එම නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(9) යම් නිශ්චිත කාලයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට බැඳී සිටි යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයෙහි නියුක්ත කරවනු ලබන අවස්ථාවක ඒ තැනැත්තා විසින් අධිකාරිය වෙනුවෙන් සේවය කරන ලද යම් කාලසීමාවක්, ඒ තැනැත්තා ආණ්ඩුවට බැඳීම් ඉටුකිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## V වන කොටස

### මුදල්

අධිකාරියේ අරමුදල

15. (1) අධිකාරියට (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියේම අරමුදලක් තිබිය යුතුය.

(2) අරමුදලට පහත දැක්වෙන මුදල් ප්‍රමාණයන් ගෙවනු ලැබිය යුතු ය:—

(අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන් ;

(ආ) අරමුදලට ත්‍යාග සහ පරිත්‍යාග වශයෙන් කවර හෝ ප්‍රභවයක් අධිකාරිය විසින් ලබා ගන්නා සියලු මුදල් ප්‍රමාණයන් ;

(ඇ) අධිකාරිය සතු වූ හෝ අධිකාරිය විසින් පරිපාලනය කරනු ලබන යම් දේපලකින් ආදායම් වශයෙන් අධිකාරිය විසින් ලබා ගන්නා සියලු මුදල් ප්‍රමාණයන් ;

(ඈ) අධිකාරිය විසින් මේ පනත යටතේ, බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ එහි කර්තව්‍ය ඉටු කිරීමේ දී ලබන සියලු මුදල් ප්‍රමාණයන්.

(2) මේ පනත යටතේ අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටුකිරීමේ දී සහ කිරීමේ දී අධිකාරිය විසින් දරනු ලබන සියලු වියදම් පියවීම සඳහා අවශ්‍යවන හා අරමුදලින් ගෙවිය යුතු යයි මේ පනතින් හෝ මේ පනත යටතේ නියමිත සියලු මුදල්, අරමුදල්වලින් ගෙවනු ලැබිය යුතු ය.

16. (1) අධිකාරිය විසින් අමාත්‍යවරයාගේ සහ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හෝ ඒ අමාත්‍ය එකඟත්වයක් ඇතිව දෙන ලද යම් පොදු අධිකාරියක නියමයන්ට අනුකූල වූ හෝ අධිකාරියේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අධිකාරියට අවශ්‍ය විය හැකි යම් මුදල් ප්‍රමාණයක් අයිරයක් මගින් හෝ අන්‍යාකාරයකින් ණයට ගැනීම, නැතහොත්, සාකච්ඡා කොට ණය වශයෙන් ලබා ගැනීම කළ හැකි ය: ණයට ගැනීමේ බලතල.

එසේ වුව ද, මේ උපවගන්තිය යටතේ අධිකාරිය විසින් ලබා ගන්නා ලද ණය මුදල් වෙනුවෙන් ආපසු ගෙවීමට ඇති මුදල්වල, මුළු එකතුව කිසිම අවස්ථාවක දී මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක් නොඉක්මවිය යුතු ය.

(2) අධිකාරිය විසින්, මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟතාව සහිතව අමාත්‍යවරයා විසින් දෙනු ලබන නියමයන් ඇතිව, පහත දැක්වෙන කාර්ය සියල්ලම හෝ ඒ අතුරෙන් යම් කාර්යයක් සඳහා (1) වන උපවගන්තිය යටතේ ණය මුදල් වශයෙන් හෝ අන්‍යාකාරයකින් මුදල් ණයට ලබාගත හැකි ය :—

(අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය යම් ඉඩම් හෝ නිශ්චල දේපළ මිලයට ගැනීම හෝ අත්කර ගැනීම ;

(ආ) (1) වන උපවගන්තිය යටතේ ණයට ගත් යම් මුදලක් ආපසු ගෙවීම.

17. (1) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. අධිකාරියේ මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය.

(2) අධිකාරිය විසින් අධිකාරියේ ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් පවත්වා ගෙනීමට සැලැස්විය යුතු ය

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීම පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, අධිකාරියේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## VI වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

*රහස්‍යභාවය ප්‍රකාශ කිරීම.*

**18.** අධිකාරියේ සෑම අධ්‍යක්ෂවරයෙක් ම, අධිකාරියේ සියලුම නිලධරයන් සහ සේවකයන්, කොමසාරිස් ජනරාල්, සෑම කොමසාරිස් වරයෙක්, දිස්ත්‍රික් කොමසාරිස් වරයෙක්, නියෝජ්‍ය කොමසාරිස් වරයෙක් සහ සහකාර කොමසාරිස් වරයෙක් විසින් ම, ස්වකීය කාර්ය ආරම්භ කිරීමට ප්‍රථම අධිකාරියේ ක්‍රියාකාරිත්වයට සම්බන්ධ සියලු කරුණු පිළිබඳව ඇති රහස්‍යතාවක් පිළිපදින බවට වූ ප්‍රකාශයක් අත්සන් කරනු ලැබිය යුතු අතර, ඒ ප්‍රකාශය මගින්—

(අ) එසේ කිරීමට අධිකරණයක් මගින් නියම කරනු ලැබූ විට ; හෝ

(ආ) මේ පනතේ විධිවිධාන අනුරෙන් යම් විධිවිධානයකට අනුකූලව කටයුතු කිරීම සඳහා, හැර ස්වකීය කර්තව්‍ය කිරීමේ දී හෝ කාර්ය ඉටුකිරීමේ දී තමා දැනගත් කරුණු කිසිවක් හෙළි නොකිරීමට ප්‍රකාශයෙන් ප්‍රතිඥා දෙනු ලැබිය යුතු ය.

*වාර්තා සහ තොරතුරු.*

**19.** (1) මේ පනත යටතේ අධිකාරියේ බලතල හා කර්තව්‍ය අතුරින් යමක් අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ හැකි හා ඉටු කළ හැකි වීමේ කාර්ය සඳහා අධිකාරිය විසින් හෝ ඒ සඳහා අධිකාරිය විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් යම් කාලයක් ඇතුළත ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් වාර්තා සහ තොරතුරු අධිකාරිය වෙත හෝ අධිකාරිය විසින් බලය දෙන ලද තැනැත්තා වෙත සැපයිය යුතු යයි යම් තැනැත්තකුට නියම කිරීම හෝ අධිකාරිය ඉදිරියේ පෙනී සිටිය යුතු යයි යම් තැනැත්තකුට නියම කිරීම කරනු ලැබිය හැකි ය.

(2) යම් වාර්තාවක් හෝ තොරතුරක් සැපයීමට හෝ අධිකාරිය ඉදිරියේ පෙනී සිටීමට හෝ (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් මගින් යම් තැනැත්තකුට නියම කරනු ලැබූ විට, යම් නීතියක විධිවිධාන යටතේ යම් වාර්තා හෝ තොරතුරු සැපයීමෙන් ඒ තැනැත්තා තහනම් කරනු ලැබ ඇති අවස්ථාවක දී හැර, එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලය ඇතුළත එම නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම ඒ තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමක නියම වලට අනුකූලව කටයුතු කරමින් (1) වන උපවගන්තිය යටතේ සපයන ලද වාර්තාවක ඇතුළත් කිසිම තොරතුරක්, අධිකාරිය විසින් පළ කිරීම හෝ යම් තැනැත්තකුට දැනුම් දීම ඒ වාර්තාව හෝ තොරතුරු සපයන තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ අධිකාරියේ කර්තව්‍ය ඉටු කරනු ලබන අවස්ථාවක දී හැර, කරනු නොලැබිය යුතු ය.

(4) අධිකාරිය ඉදිරියේ යම් ප්‍රකාශයක් කරනු ලබන සෑම තැනැත්තකුම, අධිකරණය ඉදිරියේ සාක්ෂි දෙන සාක්ෂිකරුවකු ඒ අධිකරණය ඉදිරියෙ ඔහු විසින් දෙන ලද සාක්ෂිය සම්බන්ධයෙන් හිමිකම් ලබන සියලුම වරප්‍රසාදවලට ඒ ප්‍රකාශය සම්බන්ධයෙන් හිමිකම් ලැබිය යුතු ය.

20. (1) එක් එක් වර්ෂයේ දී නියම කරනු ලැබිය හැකි යම් ලොතරැයි සංඛ්‍යාවක් අධිකාරිය විසින් පවත්වනු ලැබිය හැකි ය. ලොතරැයියක් පැවැත්වීම.

(2) අධිකාරිය විසින් සෑම ලොතරැයියක්ම නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකට පවත්වනු ලැබිය යුතු ය.

21. අධිකාරියේ සියලුම අධ්‍යක්ෂවරයන්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා රජයේ සේවකයන් වශයෙන් සලකනු ලැබිය යුතු ය. අධිකාරියේ අධ්‍යක්ෂවරුන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් වශයෙන් සැලකිය යුතු බව.

22. අධිකාරිය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය. අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් විය යුතු බව.

23. අධිකාරියේ කර්තව්‍ය ඉටුකිරීමෙහි ලා එයට උපදෙස් දීමේ සහ සහායවීමේ කාර්යය සඳහා යම් කාලයකට අධිකාරිය විසින් කාරක සභා පිහිටුවනු ලැබිය හැකි අතර, ඒ කාරක සභාවල සේවය කිරීම සඳහා අවශ්‍ය යයි සලකන යම් තැනැත්තන් පත් කරනු ලැබිය හැකි ය. කමිටු

24. (අ) අධිකාරිය විසින් මේ පනත මගින් හෝ ඒ යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් එයට විරුද්ධව ; හෝ

(ආ) අධිකාරියේ යම් අධ්‍යක්ෂවරයකු නිලධරයකු හෝ සේවකයකු විසින් මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත හෝ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව හෝ

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය. මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත හෝ කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව.

25. 1988 අංක 78 දරන මුදල් සමාගම් පනතේ 2 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, ඒ පනතේ විධිවිධාන, 5 වන වගන්තියේ (ආ) ඡේදය යටතේ අධිකාරිය විසින් කරගෙන යනු ලබන කටයුතු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය. 1988 අංක 78 දරන මුදල් සමාගම් පනතේ විධිවිධාන අදාළ නොකිරීම

වැරදි.

26. (1) යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ කරනු ලබන ප්‍රකාශයක තමාගේ හෝ තම භාර්යාවගේ හෝ ස්වාමිපුරුෂයාගේ, දරුවන්ගේ හෝ යැපෙන්නන්ගේ වත්කම් සහ බැරකම් වලට අදාළව, තමාගේ දැනීම අනුව අසත්‍ය වූ හෝ වැරදි වූ ප්‍රකාශයක් කරනු ලැබූ විට, ඒ තැනැත්තා මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙදහසකට නොවැඩි දඩයකට හෝ එක් වර්ෂයකට නොවැඩි කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතු ය.

(2) වැඩසටහන යටතේ අර්ථලාභියකු වන තැනැත්තකු විසින්—

(අ) තමාගේ වත්කම්වලට සහ බැරකම්වලට ; හෝ

(ආ) තම භාර්යාවගේ හෝ පුරුෂයාගේ හෝ දරුවන්ගේ හෝ වෙනත් යැපෙන්නන්ගේ වත්කම් සහ බැරකම්වලට අදාළව මේ පනත යටතේ කරන ලද ප්‍රකාශයක සපයන ලද විස්තර වල යම් වැදගත් වෙනසක් ඒ වෙනසේ දින සිට මාස දෙකක කාලයක් ඇතුළත අධිකාරිය හෝ කොමසාරිස් ජනරාල් වෙත

දැනුම් දීම, සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හරින යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙදහසකට නොවැඩි දඩයකට හෝ එක් වර්ෂයකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(3) (අ) 19 වන වගන්තිය යටතේ කරන ලද විධාන ලද ඇස්තමේන්තු නියමයට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින ; හෝ

(ආ) එවැනි යම් ඇස්තමේන්තු නියමයකට අනුකූලව කටයුතු කිරීමේ දී යම් අසත්‍ය හෝ වැරදි වාර්තාවක් හෝ තොරතුරක් දැන දැනම සපයන

යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙදහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(4) (අ) මේ පනත යටතේ ස්වකීය කර්තව්‍ය ඉටුකිරීමේ දී අධිකාරියේ යම් නිලධරයකුට ප්‍රතිරෝධය පාන, බාධා කරන, ඔහුගේ කටයුතුවලට මැදිහත්වන, නැත හොත්, ඒ කටයුතුවලට මැදිහත්වීමට තැත් කරන හෝ බලපෑම් කරන ; හෝ

(ආ) මේ පනත යටතේ වැරදි ප්‍රකාශයක් කිරීමට යම් තැනැත්තකු පොළඹවන හෝ පෙළඹවීමට තැත් කරන

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දසදහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතු ය.

(5) (අ) 18 වන වගන්තිය යටතේ රහස්‍යතා දිවුරුමක් ගැනීමට නියමිත තැනැත්තකු වශයෙන්, එම දිවුරුම නොගෙන මේ පනත යටතේ ක්‍රියා කරන ; හෝ

(ආ) 18 වන වගන්තියේ විධිවිධාන හෝ ඒ වගන්තිය යටතේ ගත් දිවුරුමක් කඩකරමින් ක්‍රියාකරන,

අධිකාරියේ යම් අධ්‍යක්ෂවරයකු, කොමසාරිස් ජනරාල්, යම් කොමසාරිස් වරයකු, දිස්ත්‍රික් කොමසාරිස්වරයකු, නියෝජ්‍ය කොමසාරිස් වරයකු, සහකාර කොමසාරිස් වරයකු හෝ යම් නිලධරයකු හෝ සේවකයකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙදහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතු ය.

(6) මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් කඩකරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

නියෝග

27. (1) පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඒ අතුරෙන් යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) නියම කරනු ලැබිය යුතු යයි මේ පනතින් නියමිත හෝ බලය දෙන ලද සියලු කරුණු ;

(ආ) වැඩසටහන යටතේ අර්ථලාභියකු වීමේ යෝග්‍යතාව පිළිබඳ කොන්දේසි ;

(ඇ) වැඩසටහන යටතේ අර්ථලාභියකු වීමට ඉල්ලීම් කරනු ලැබිය යුතු ආකාරය ;

(ඈ) ඒ අර්ථලාභීන් විසින් වැඩසටහන් යටතේ සහන ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කොන්දේසි සහ වැඩසටහන යටතේ ඒ අර්ථලාභීන් වෙත සහන ප්‍රදානය කරනු ලැබිය යුතු ආකෘතිය සහ ආකාරය ;

(ඉ) මේ පනතේ කාර්ය සඳහා සියලු දැන්වීම් සහ ප්‍රකාශ නිකුත් කරනු ලැබිය යුතු සහ සාදනු ලැබිය යුතු ආකාරය ;

(ඊ) වැඩ සටහන යටතේ අර්ථලාභීන් විය යුතු යයි ප්‍රකාශිත තැනැත්තන්ගේ ලැයිස්තු කලින් කල ප්‍රකාශයට පත් කිරීම.

(2) (1) වන උප වගන්තිය යටතේ සාදන ලද සෑම නියෝග යක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එය පළ කරනු ලැබූ දින හෝ නියෝගයෙහි නිශ්චිත යම් පසු දිනයක හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝග යක්ම, එය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකිතාක් ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ අනනුමතයේ දින සිට, එහෙත්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය. යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකන ලද දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බල පැවැත් විය යුතු බව.

**28.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු ය.

අර්ථ නිරූපණය

**29.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"පළාත් පාලන ආයතනය" යන්නෙන් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි යම් සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන හෝ ඉටු කරනු ලබන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍ය වලට අනුරූපීවන හෝ සමානවන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, හා ඉටුකිරීම සඳහා යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ ඇතිකරන ලද හෝ පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ ;

"පළාත් සභාව" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII අ වන පරිච්ඡේදය යටතේ පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ.

"තරුණයා" යන්නෙන්, වයස අවුරුදු දහ අටත් තිස් පහත් අතර, යම් තැනැත්තකු අදහස් වේ ;

## උපලේඛනය (3(3) වන වගන්තිය)

## අධිකාරියේ අධ්‍යක්ෂවරුන්ට අදාළ විධිවිධාන

1. යම් තැනැත්තකු

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම්; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල තැනැත්තකු බවට තීරණය කර ඇත්නම් හෝ ප්‍රකාශ කර ඇත්නම්; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ වස්තු භංගත්වයට පත් හෝ බුන්වත් තැනැත්තකු බවට ප්‍රකාශ කරනු ලැබ නිදහස් නොකරන ලද වස්තුභංගත්වයට පත් හෝ බුන්වත් තැනැත්තකු නම්; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් (අත්හිටවූ දණ්ඩන නියමයක් ඇතුළුව) බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් පනවනු ලැබූ තැනැත්තකු වේ නම්; හෝ

(ඉ) අධ්‍යක්ෂවරයකු වශයෙන් ඔහු විසින් ස්වකීය කර්තව්‍ය කෙරෙහි හානිකර ලෙස බලපෑ හැකි යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් ඇති තැනැත්තකු වේ නම්

ඒ තැනැත්තා අධිකාරියේ අධ්‍යක්ෂවරකු වශයෙන් පත්කරනු ලැබීමට හෝ අධ්‍යක්ෂවරයකු වශයෙන් දිගටම කටයුතු කිරීමට හෝ නුසුදුස්සකු විය යුතු ය.

2 පත් කරන ලද අධ්‍යක්ෂවරයකු විසින් අමාත්‍යවරයා වෙත යොමු කරනු ලබන ලිපියක් මගින් සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

3. අමාත්‍යවරයා විසින්, යම් පත්කළ අධ්‍යක්ෂවරයකු කිසිම හේතුවක් නොදක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, ඒ ඉවත් කිරීම සම්බන්ධයෙන් කිසිම අධිකරණයක දී හෝ විනිශ්චයාධිකාරයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

4. (1) පත් කරන ලද සෑම අධ්‍යක්ෂවරයකුම මියයාමෙන් ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය හිස් කළහොත් මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, ඔහු නැවත පත් කිරීම සඳහා සුදුස්සකු විය යුතු ය:

එසේ වුවද, මියයෑමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ අන්‍යාකාරයකින් ධුරය හිස් කර ඇති අධ්‍යක්ෂවරයකු වෙනුවට පත් කරනු ලබන යම් අධ්‍යක්ෂවරයකු, ඔහු කලින් ධුරය හිස් කළහොත් මිස, ඔහු අනුප්‍රාප්ත වන අධ්‍යක්ෂවරයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(2) රෝගාතුරවීම, අබලතාවයට පත්වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතු කොටගෙන ස්වකීය ධුරයෙහි කටයුතු ඉටු කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ පත්කළ අධ්‍යක්ෂවරයකුට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක අමාත්‍යවරයා විසින්, අවශ්‍යතාවෝචිත පරිදි, අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් කටයුතු කිරීම සඳහා වෙනත් යම් අධ්‍යක්ෂවරයෙක් පත් කිරීම හෝ ඒ පත්කළ අධ්‍යක්ෂවරයා වෙනුවට කටයුතු කිරීම සඳහා, වෙනත් යම් තැනැත්තකු පත් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

5. අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ අධ්‍යක්ෂවරයන්ට, අමාත්‍යවරයා විසින් නිශ්චිත කරනු ලබන පාරිශ්‍රමිකයන් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

6. අධිකාරිය විසින් එළඹෙන හෝ එළඹීමට යෝජිත ගිවිසුමකට කෙලින් ම හෝ අන් අයුරකින් සම්බන්ධතාවක් ඇති යම් අධ්‍යක්ෂවරයකු විසින්, ස්වකීය සම්බන්ධතාවේ ස්වභාවය අධිකාරියේ රැස්වීමක දී අනාවරණය කරනු ලැබිය යුතු ය. මේ අනාවරණය අධිකාරියේ රැස්වීම් වාර්තාවල වාර්තා කරනු ලැබිය යුතු අතර, ඒ අධ්‍යක්ෂවරයා එම ගිවිසුම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට සහභාගි නොවිය යුතු ය. එසේ වුවද යම් අධ්‍යක්ෂවරයකු රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක නිලධරයකු හෝ රාජ්‍ය සංස්ථාවක අධ්‍යක්ෂවරයකු වීමේ හේතුවෙන් ගිවිසුමකට ඒ අධ්‍යක්ෂවරයාට ඇති සම්බන්ධතාවය මේ ඡේදය යටතේ අර්ථානුකූලව සම්බන්ධතාවක් වශයෙන් සලකනු නොලැබිය යුතු ය.

7. (1) තත්කාර්යය වෙනුවෙන්, අමාත්‍යවරයා වෙත යොමු කරන ලද ලිපියක් මගින් අධ්‍යක්ෂ ජනරාල් විසින් අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් වූ ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් කවර හෝ වේලාවක, කිසිදු හේතුවක් නොදක්වා, අධ්‍යක්ෂ ජනරාල්වරයා අධ්‍යක්ෂ ජනරාල් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ධුර කාලය, අධිකාරියේ ඔහුගේ සාමාජිකත්වයේ කාලය විය යුතු ය.

8. අධ්‍යක්ෂ ජනරාල්වරයා අධිකාරියේ සියලුම රැස්වීම්වල මූලසුන දැරිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා අධිකාරියේ යම් රැස්වීමකට නොපැමිණි අවස්ථාවක නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂවරයෙක් ඒ රැස්වීමේ මූලසුන දැරිය යුතු ය.

9. (1) මේ ඡේදයේ අනෙකුත් විධිවිධානවලට යටත්ව, අධිකාරිය විසින් එහි රැස්වීම් පිළිබඳව එවැනි රැස්වීම්වල දී කටයුතු කරගෙන යාම පිළිබඳව කාර්ය පටිපාටිය විධිමත් කර ගත හැකි ය.

(2) අධිකාරියේ රැස්වීමක ගණපූරණය අධ්‍යක්ෂවරුන් හතර දෙනෙක් විය යුතු ය.

10. අධිකාරියේ යම් පුරප්පාඩුවක් ඇතිවීමේ හෝ එහි අධ්‍යක්ෂවරයන් අතුරෙන් යම් අධ්‍යක්ෂවරයකු පත් කිරීමේ යම් දෝෂයක් තිබීමේ හෝ හේතුව නිසාම පමණක්, අධිකාරියේ කිසිම ක්‍රියාවක් තීරණයක් හෝ කටයුත්තක් අවලංගු වන්නේ නොවිය යුතු ය.

11. (1) අධිකාරියේ මුද්‍රාව, අධිකාරිය විසින් කලින් කල තීරණය කරනු ලබන යම් තැනැත්තකුගේ භාරයේ තිබිය යුතු ය.

(2) අධිකාරියේ මුද්‍රාව, අධිකාරිය විසින් තීරණය කරනු ලබන ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) අධිකාරියේ මුද්‍රාව, අධ්‍යක්ෂවරයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට හෝ නොතැබිය යුතු අතර, තමන් ඉදිරියේ තැබූ බවට සලකුණක් වශයෙන් ඒ දෙදෙනා විසින් ම ඒ සාධන පත්‍රයෙහි හෝ ලේඛනයෙහි අත්සන් කරනු ලැබිය යුතු ය.

(4) අධිකාරියේ මුද්‍රාව තබන සාධන පත්‍ර හෝ ලේඛන පිළිබඳ ලේඛනයක් අධිකාරිය විසින් පවත්වාගෙන යා යුතු ය.

12. 3 (1) වගන්තියේ (අ) ඡේදයේ සඳහන් අධ්‍යක්ෂවරයකු විසින් අධිකාරියේ රැස්වීම්වලට, [illegible] රැස්වීම්වලට [illegible] 30 [illegible] අමාත්‍යාංශයේ [illegible] නම් කරනු ලැබිය හැකි අතර, ඒ [illegible] දැක්වූ [illegible] ලැබිය යුතු ය.

13. 12 වන වගන්තිය යටතේ [illegible] නම් කරනු ලබු [illegible] අධිකාරියේ රැස්වීම්වල [illegible] අධිකාරියේ රැස්වීමට [illegible] 12 වන වගන්තිය යටතේ [illegible] යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස් වර්ක්ස් හවුස්, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙහි අධිකාරි වෙත තැපැල් වර්ෂයකට දෙසැම්බර් මස 15 වැනි දිනට දායක මුදල් යැවීම සඳහා එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.